පසුගිය දිනෙක, තම ප්‍රියතම තරුවක් සොයා ඉන්දියාවට යෑමේ අරමුණින් නිවසින් පැන ගිය අනුරාධපුරයේ දැරියන් තිදෙනා සම්බන්ධයෙන් ලිපියක් සිළුමිණ පුවත්පතේ (01/09) දක්නට ලැබිණි.

මෙම ලිපිය තුළ එම දැරියන් තිදෙනාගේ සමූහ ඡායාරූපයක් තිබූ අතර, එහි ඔවුන්ගේ මුහුණු හඳුනාගත නොහැකි ලෙසින් බොඳ කර දක්වා තිබීම ප්‍රශංසාත්මක වෙයි.

කෙසේ නමුත්, ගැටළුවට කාරණය වන්නේ, එම ඡායාරූපය සමගින්, ඔවුන් තිදෙනාගේ නම් සඳහන් කර තිබීමයි.

බාලවයස්කරුවන්ට සිය පාසල් සමය අනවශ්‍ය අතපෙවීම් වලින් තොරව සම්පූර්ණ කරගන්නට නිදහස තිබිය යුතු බව මාධ්‍ය ආචාර ධර්ම පවසයි. යුනිසෙෆ් සංවිධානය මඟින්, දරුවන් පිළිබඳව වාර්තා කිරීමේදී පිළිපැදීම යෝග්‍ය යැයි මාධ්‍යවේදීන් වෙත ඉදිරිපත් කරන මාර්ගෝපදේශයන් හි සඳහන් වන්නේ ද, දරුවන් අවදානමක හෙළන කිසිදු තොරතුරක් ප්‍රකාශයට පත් නොකරන ලෙසයි.

ඒ අනුව,

1) මෙම බාලවයස්කාර දැරියන්ගේ මුහුණු බොඳ කර තිබුණත්, ඔවුන්ගේ නම් පළ කිරීම ඔස්සේ ඔවුන්ගේ අනන්‍යතාවය හෙළිදරව් නොවනු ඇතිද?

2) ඒ ඔස්සේ ඔවුන්ගේ පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කරගැනීමට බාධා නොපැමිණෙනු ඇතැයි අපට සහතික විය හැකිද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:

https://www.editorscode.org.uk/the_code.php
https://www.unicef.org/eca/media/ethical-guidelines